කාණ්ඩය - 7
කලාපය - 1
වසර - 2015

# ප්‍රගතිය

## ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ ප්‍රකාශණය

PUBLISHED BY THE SRI LANKA - CHINA FRIENDSHIP ASSOCIATION

ඉතිහාසයේ ප්‍රථමවරට ශ්‍රී ලංකාවේ චීන තානාපති කාර්යාලය, චීනයේ ප්‍රමුඛතම හවුල්කරුවන් 10 දෙනාට සම්මාන පිරිනැමීම, 2014 ජනවාරි 17 දා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සිදුවිය. ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ සහභාගිත්වය ඇතිව පැවැත්වූ, චීන නව අවුරුදු උළෙලේදී ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය දෙවැනි සම්මානලාභී ආයතනයවූ අතර පළමුවැන්න වූයේ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමය. චීන මහජන සමූහාණ්ඩුවේ තානාපති වූ ජියැංහාඕ (Wu Jianghao) මහතා ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ සභාපති නීතිඥ ආනන්ද ගුණතිලක මහතාට සම්මානය පිරිනැමූ මොහොත.






සම්මාන ප්‍රදානය කරා පියනැගීම



2015 පෙබරවාරි 26 දා ශ්‍රී ලංකා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අබියසදී, නව චීන තානාපති යී ක්ෂියැන්ලියැං (Yi Xianliang) මැතිතුමා අක්ත පත්‍ර පිරිනැමූ අවස්ථාව

**ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය**

# ප්‍රගතිය

1973 දී ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය විසින් "ප්‍රගතිය" සඟරාව ආරම්භ කරන ලද්දේ 1949 ඔක්තෝබර් 01 දා ජය කෙහෙළි නැංවූ චීන විප්ලවයේ විජයග්‍රහනයෙන් 24 වසරකට පසුව චීන මහජන සමූහාණ්ඩුව සමාජවාදී සමාජ - ආර්ථික ක්‍රමය චීනයේ ගොඩනඟමින් තිබියදීය. චීන ඉතිහාසය විසින් බිහි කරන ලද ශ්‍රේෂ්ඨතම නායකයාවූ සභාපති මාඕ සේතුං ජීවත්ව සිටිමින්, චීන කොමියුනිස්ට් පක්ෂයත් චීනයේ සමාජවාදී පාලන ක්‍රමයත් චීන ජනතාවගේ සමාජවාදී චින්තන පිළිවෙතත් මෙහෙයවමින් සිටියදීය. එහෙයින් චීනයේ සමාජවාදී ප්‍රතිපත්ති හා සමාජවාදී භාවිතයත්, සමාජවාදී ආර්ථිකයෙන් චීනය ඒ වන විට ගොඩනගා තිබූ සංවර්ධනයත් අපේ ජනතාවට හඳුන්වාදීම "ප්‍රගතිය " ගෙන ආ පණිවුඩය වූයේය.

විටින් විට පළ කරන ලද "ප්‍රගතිය" 1973 - 1983 දස වසර තුළ ප්‍රකාශණයට පත් කර ඇත්තේ කලාප 15 ක් පමණකි. ඉන් 5 ක් ම පළවූයේ 1976 දීය. එවකට ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය සතුව පැවැති ප්‍රජා ප්‍රකාශකයෝ සහ ප්‍රජා මුද්‍රණාලය ඊට උපස්ථම්භක විණි. සවිමන් උරුගොඩවත්ත, සුධර්මන් ද සිල්වා ධර්මවර්ධන, ධර්මදාස කල්දේරා, කේ. ජනක, ශාන්තිනී ගුණවර්ධන වික්‍රමසිංහ, සමරපාල ජේ. ලියනගේ, ආනන්ද ගුණතිලක සහ සේන තෝරදෙණිය මහත්ම මහත්මියන් "ප්‍රගතිය" සංස්කරණයට දායක වූහ. කලාප 15 න් 10 ක් ම සංස්කරණය කරන ලද්දේ කලක් "ප්‍රගතිය" භාර සංවිධායක ලේකම් වූ සංගමයේ වර්තමාන සභාපති නීතිඥ ආනන්ද ගුණතිලක මහතා විසිනි. "ප්‍රගතිය" ආරම්භ කිරීමට නායකත්වය දී මුල් සඟරා 12 ට හිටපු සභාපතිනි තේජා ගුණවර්ධන මැතිනියද, හිටපු සභාපති ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එස්. ඩබ්ලිව්. වල්පිට, හිටපු ප්‍රධාන ලේකම් සවිමන් උරුගොඩවත්ත සහ හිටපු භාණ්ඩාගාරික සුධර්මන් ද සිල්වා ධර්මවර්ධන මහත්වරුන් ද විසින් මාර්ගෝපදේශකත්වය සපයන ලදී.

දිගු විරාමයකට පසුව යළිත් "ප්‍රගතිය" පළ කිරීමට ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ ජාතික විධායක මණ්ඩලය තීරණය කළේ ශ්‍රී ලංකාව සහ චීනය අතර මිත්‍රත්වයේ නව ප්‍රවණතාවයන් ගැනද, චීනයේ සමාජ ආර්ථික දේශපාලනික වර්ධනයන් ගැන මෙන්ම සංගමය විසින් දියත් කරන ලද විවිධ කාර්යභාරයන් ගැනද සාමාජිකත්වය හා සංගමයේ මිතුරන් දැනුවත් කිරීම උදෙසාය. පසුගිය වසර කීපය තුළ සංගමය විසින් සාර්ථකව සංවිධානය කරන ලද අති විශාල වැඩකොටසෙන් යම් ප්‍රමාණයක් හෝ විදහා දැක්වීම උදෙසා මෙම කලාපය මූලික වශයෙන් යොදාගෙන ඇත.

1973 දී "ප්‍රගතිය" ආරම්භ කළ යුගයට සසඳා බැලූ කල වර්තමාන චීනය සමස්ථ වෙනසකට බඳුන් වී ඇත. එදා සංවර්ධනය වෙමින් පවතින සමාජවාදී රාජ්‍යයක් වූ චීනය අද මුළුමහත් ලෝකයේම දෙවැනි ආර්ථිකය වී තිබේ. නොබෝ දිනකින් චීනය ලෝකයේ සෑම සියලු ක්ෂෙත්‍රයකම සුපිරි බලවතා වීම කිසිවකුට වැලැක්විය නොහැක.

මෙම දැවැන්ත වර්ධනයට මග පෑදූ ආර්ථික ක්‍රමය චීනය විසින් හඳුන්වනු ලබන්නේ "සමාජවාදී වෙළඳපොල ආර්ථිකය" යනුවෙනි. මෙම ආර්ථිකය සාක්ෂාත් කළ දේශපාලන පිළිවෙත "චීන චරිතාංග සහිත සමාජවාදය" යැයි චීන කොමියුනිස්ට් පක්ෂය විසින් හඳුන්වනු ලැබේ. 1978 දෙසැම්බර් මස පක්ෂය විසින් මූලිකව පිළිගන්නා ලද චීන නායක ඩෙං ශියාඕ පිං ගේ න්‍යායය "චීන චරිතාංග සහිත සමාජවාදය"යේ දාර්ශනික පදනම වන්නේය.

ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය 1950 ආරම්භ කළේ චීනය දුබල, කොන්වුනු, මාස 12 ක් වයසැති ළදරු සමාජවාදී රාජ්‍යයක්ව තිබියදීය. එදා ප්‍රතිපත්ති මූලික ස්ථාවරයකින් අපේ ජනතාව හා චීන ජනතාව අතර මිත්‍රත්වය උදෙසා දියත් වූ මෙම සංගමය අද ලෝකයේ සුපිරි බලවතකු බවට චීනය වර්ධනය වී ඇති තත්වය තුළද දෙරටේ දෙජනතාවන් අතර මිත්‍රත්වය උදෙසා එක සේ ඇප කැපවී සිටී.

අප "ප්‍රගතිය" පළ කරන්නේ මෙකී ජනතා මිත්‍රත්වය වඩාත් අර්ථවත් කිරීම හා ශක්තිමත් කිරීම සඳහාය. "ප්‍රගතිය" ආරම්භ කළ අවධියේ මෙන්ම ඉදිරියේදී ද අප ශ්‍රී ලංකා - චීන මිත්‍රත්වයේ දර්ශනය නිරවුල් කිරීම උදෙසා ද, ශක්තිමත් කිරීම උදෙසාද, ක්‍රියා කරනවා ඇත. අප සංගමයේද ශ්‍රී ලංකා - චීන මිත්‍රත්වයේද පුවත් හා විමර්ෂණ පමණක් නොව මෙම මිත්‍රත්ව සංකල්පය ප්‍රතිපත්ති මූලිකව වර්ධනය කිරීම උදෙසාද "ප්‍රගතිය" සක්‍රීයව හා සවිඥානකව දායක වන්නේය.

## ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය

### නිලධාරී මණ්ඩලය

සභාපති : නීතිඥ ආනන්ද ගුණතිලක මහතා

ප්‍රධාන ලේකම් : නීතිඥ සුමති ධර්මවර්ධන මහතා

භාණ්ඩාගාරික : ගාමිණී බණ්ඩාර රාජනායක මහතා

උප සභාපතිවරු : අජිත් ධර්මවර්ධන මහතා
දිනේෂ් කීර්තිනන්ද මහතා
ජනාධිපති නීතිඥ නිහාල් ජයවර්ධන මහතා
අරුණ ද සිල්වා මහතා
ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතා

ජාතික විධායක
මණ්ඩල සභිකයන් : දයා ලංකාපුර මහතා
චින්තා ගුණතිලක මහත්මිය (උප භාණ්ඩාගාරික)
වසන්ත කුලතුංග මහතා
මේජර් කේ. ජී. චන්ද්‍රසිරි මහතා (නියෝජ්‍ය ලේකම්)
මේජර් (වෛද්‍ය) හිරාන් විමලරත්න මහතා
(සංවිධායක ලේකම්)
තිලක් බොතේජු මහතා
නිසාන් ද සිල්වා මහතා (නියෝජ්‍ය ලේකම්)
නීතිඥ රසික බාලසූරිය මහතා
(නියෝජ්‍ය ලේකම්)
නාලක සේනානායක මහතා (නියෝජ්‍ය ලේකම්)
ගැමුණු වීරවර්ධන මහතා
නීතිඥ ප්‍රේමාදර දිසානායක මහතා
උපාලි රංජිත මහතා
නීතිඥ විනීන්ද්‍ර වීරමන් මහතා
වෛද්‍ය අසේනි ගම්මන්පිල මහත්මිය
චන්දන විජේකෝන් මහතා (විකල්ප සභික)
ප්‍රේම් දිසානායක මහතා (විකල්ප සභික)
සමන් අතාවුදහෙට්ටි මහතා (විකල්ප සභික)


ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය
ප්‍රධාන කාර්යාලය : 55/25, ගැමුණු මාවත, උඩුමුල්ල පාර,
බත්තරමුල්ල.
දුරකථන : 011-2863268
071-8098970 (සභාපති)
077-7711733 (ප්‍රධාන ලේකම්)



**'ප්‍රගතිය'** සංස්කාරක මණ්ඩලය :
චන්දන විජේකෝන් මහතා
දයා ලංකාපුර මහතා
තිලක් බොතේජු මහතා




ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය සහ ජාත්‍යන්තර හුවමාරු උදෙසා බෙයිජිං රාජ්‍ය නොවන සංගමය (Beijing NGO Association) අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම

ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය හා බෙයිජිං රාජ්‍ය නොවන සංවිධාන සංගමය පැවැත්වූ සම්මන්ත්‍රණය






ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ හා බෙයිජිං රාජ්‍ය නොවන සංවිධාන සංගමයේ (Beijing NGO) නියෝජිතයන් අවබෝධතා ගිවිසුමෙන් පසු

ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය හා බෙයිජිං කාන්තා සංගමය (Beijing NGO Women's Association) පැවැත්වූ ප්‍රදර්ශනයේදී




බෙයිජිං රාජ්‍ය නොවන සංවිධාන සංගමයේ කාර්ය මණ්ඩලයේ නත්තල් සුභ පැතුම් ...!
X'Mas Greetings of the Staff of Beijing NGO





ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ සභාපති සහ ජාත්‍යන්තර අවබෝධය සඳහා වූ චීන සංගමයේ (CAFIU) මහ ලේකම් නී ජියාන් (NI JIAN) 2013 අප්‍රේල් 1 දා කොළඹදී අත්සන් කළ අවබෝධතා ගිවිසුම (SLCFA - CAFIU MOU: 1 April 2013)

CAFIU සංවිධානයේ නියෝජ්‍ය මහ ලේකම් (Liu Kaiyang) ලියු කයියැං මහතා උත්සවාකාරයෙන් පිළිගැනීම






ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය හා CAFIU සංවිධානය එක්ව ශ්‍රී ලංකා පදනම් ආයතන ශ්‍රවණාගාරයේ පැවැත්වූ 'චීන සිහිනය' (Chinese Dream) සම්මන්ත්‍රණය



ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ සභාපති ප්‍රමුඛ නියෝජිතයන් හා CAFIU සංවිධානයේ මහ ලේකම් NI JIAN ප්‍රමුඛ නියෝජිතයන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කතානායක චන්දිම වීරක්කොඩි මහතා පාර්ලිමේන්තුවේදී හමුවූ අවස්ථාව.



ලියු කයියෑං (Liu Kaiyang) මහතා සම්ප්‍රදායික පහන දල්වමින්



ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය සහ ජාත්‍යන්තර අවබෝධය සඳහාවූ චීන සංගමය 'චීන සිහිනය' (Chinese Dream) පිළිබඳව පැවැත්වූ සම්මන්ත්‍රණයේ දී එම සංගමයේ නියෝජ්‍ය මහ ලේකම් ලියු කයියෑං (Liu Kaiyang) මහතා සභාව ඇමතීම




කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේ දී 2013 මැයි 4 දා පවත්වන ලද ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ විශේෂ සාමාජික මහා සභා රැස්වීම අමතා සංගමයේ සභාපති නීතිඥ ආනන්ද ගුණතිලක මහතා කතා කළ අවස්ථාව

සංගමයේ ප්‍රධාන ලේකම් නීතිඥ සුමති ධර්මවර්ධන මහතා ව්‍යවස්ථා සංශෝධන ඉදිරිපත් කිරීම





විශේෂ මහා සභා රැස්වීමට සහභාගි වූ සාමාජික පිරිසෙන් කොටසක්



2013 මැයි 4 දා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැති විශේෂ සාමාජික මහා සභාවට සහභාගිවූ සංගමයේ යාවජීව සාමාජික සමූහය





# ශ්‍රී ලංකා - චීන තානාපති සබඳතා පිහිටුවාලීමේ 55 වැනි සංවත්සරය හා රබර් - හාල් ගිවිසුමේ 60 වැනි සංවත්සරය සැමරීම සඳහා ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය බණ්ඩාරනායක ජාත්‍යන්තර සමරු ශාලාවේදී 2012 ජූලි 10 දා පැවැත්වූ ඓතිහාසික උත්සව රැස්වීම





ජනාධිපතිවරයා නියෝජනය කරමින් අගමැති දි. මු. ජයරත්න මහතාගේ සම්ප්‍රාප්තිය හා සභාව ඇමතීම

චීන තානාපති වූ ජියැංහාඕ (Wu Jianghao) මහතා සභාව ඇමතූ මොහොත

සහභාගි වූ ආරාධිතයන්





ඉදිරි පෙළ වමේ සිටඃ අගමැති දි. මු. ජයරත්න මහතා, චීන තානාපති තුමා හා මැතිනිය, සංගමයේ සභාපති නීතිඥ ආනන්ද ගුණතිලක මහතා සහ විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා





විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා දේශනය පවත්වමින්



විදේශ ඇමති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා සභාව අමතමින්



ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ
පැරැණි නායකයන් උදෙසා සම්මාන පිදීම

ආරම්භක නායිකාව, තේජා ගුණවර්ධන සභාපතිනියගේ මුණුබුරු ලානු ගුණවර්ධන මහතා (වම), ප්‍රධාන ලේකම් ආනන්ද කුමාර මහතාගේ ඥාති පුත්‍ර සිරිමෙවන් කුලතිලක මහතා (දකුණ) සහ භාණ්ඩාගාරික සුධර්මන් ද සිල්වා ධර්මවර්ධන මහතාගේ පුත් අජිත් ධර්මවර්ධන මහතා (මැද).

ශ්‍රී ලංකා - චීන තානාපති සබඳතා හා වෙළෙඳ සබඳතා සංවත්සර සැමරීමේ උත්සව රැස්වීම 2012 ජූලි මස 10 දා ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය විසින් කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. එම ඓතිහාසික උත්සව රැස්වීම නිමිත්තෙන් චීන තානාපති කාර්යාලයේදී සංගමයේ ජාතික විධායක මණ්ඩල සභිකයන්ට 2012 ජූලි මස පැවැත්වූ රාත්‍රී භෝජන සංග්‍රහයෙන් පසු සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු



ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ උප සභාපති, දිනේෂ් කීර්තිනන්ද මහතා, 2013 ජූනි මස චීනයේ කුන්මිං නුවර පැවැත්වූ දකුණු ආසියා මිත්‍ර සංවිධාන වැඩමුළුව අමතමින් (Kunming: South Asia Forum of CPAFFC)



ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය හා චීනයේ හෙනාන් (Henan) ප්‍රාන්ත මිත්‍ර සංගමය අතර අවබෝධතා ගිවිසුම 2013 මැයි මස 19 දා උප සභාපති අජිත් ධර්මවර්ධන මහතා අත්සන් කළ මොහොත






චීනයේ ජියැංෂි (Jiangxi) ප්‍රාන්ත පාලක මණ්ඩලයේ සභාපති හුආං යුජින් (Huang Yuejin) මහතා ප්‍රමුඛ නියෝජිතයන්, 2013 දෙසැම්බර් 5 දා ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය විසින් කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හොටලයේදී පිළිගැනීම

## චීන බෞද්ධ සංගමයේ (Buddhist Association of China) ආධාරයෙන් බෞද්ධ දහම් පාසල්වලට පොත් බෙදාදීමේ ව්‍යාපෘතිය - 2011




2011 චීන තානාපති යැං ෂියුපිං (Yang Xiuping) මැතිනිය ප්‍රමුඛව ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ නියෝජිතයන් වවුනියාවේ සිංහල, දෙමළ හා මුස්ලිම් පාසල් තුනකට ආධාර හා අභ්‍යාස පොත් කට්ටල බෙදාදීමට සහභාගිවූ අවස්ථාව

චීන බෞද්ධ සංගමයේ ආධාරයෙන් මුද්‍රණයකර බෙදාදුන් අභ්‍යාස පොත්වල පිටකවර






විදේශ රටවල් සමග චීන ජනතා මිත්‍ර සංගමයේ සංස්කෘතික අංශයේ (Cultural Exchange Department of the CPAFFC) අධ්‍යක්ෂ ජෙනරාල් මා ෂියාඕමිං (Director General Ma Xiaoming) සහ අධ්‍යක්ෂ චෞ ජිආන්පිං (Director Zhou Jianping) ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේ සංගමයේ සභාපති හා ප්‍රධාන ලේකම් විසින් කොළඹදී පිළිගත් අවස්ථාව

චීනයේ උගත් ශ්‍රී ලාංකිකයන් අගැයීමට ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය 2013 අගෝස්තු 23 වෙනි දින කොළඹ 'රජ බොජුන්' අවන්හලේදී පැවැත්වූ සාදයේ අවස්ථා



සංවිධායක මණ්ඩලයේ සභාපති මේජර් (වෛද්‍ය) හිරාන් විමලරත්න මහතා පොල්තෙල් පහන දැල්වූ මොහොත. (චීන තානාපතිතුමා, යුධ හමුදාපති දයා රත්නායක මහතා සහ ප්‍රධාන සම්පත්දායක සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික චන්ද්‍රසිරි ජයසේකර මහතා පසුබිමේ දිස්වේ.)



2013 චීන ගිම්හාන වැඩමුළු සඳහා කොන්ෆියුසියස් ආයතනයේ ආධාරයෙන් චීනයට යැවූ ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ තරුණ නියෝජිතයන් මෙහි දැක්වේ



**2014 නොවැම්බර් 06 දා ආචාර්ය එන්. එම්. පෙරේරා ශ්‍රවණාගාරයේදී ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ ශිෂ්‍ය හා තරුණ මණ්ඩලය ආරම්භ කිරීමේ අවස්ථාව**







2014 නොවැම්බර් 06 වෙනි දින කොළඹ 08 ආචාර්ය එන්. එම්. පෙරේරා ශ්‍රවණාගායේදී තෝරාගන්නා ලද ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ ශිෂ්‍ය හා තරුණ මණ්ඩලයේ නිලධාරීන් හා ක්‍රියාකාරී මණ්ඩලය.

**සභාපති මණ්ඩලය :**
චලනී කුලතුංග, තරිඳු සුරේෂ් ගුණතිලක,
කැලුම් කොඩිතුවක්කු
**සංවිධායක ලේකම්:** තමර ධනංජය ගුණරත්න
**මුදල් ලේකම්** : තිලාන් කුලරත්න

**ක්‍රියාකාරී මණ්ඩලය :** ඩිලක්ෂි කරුණාරත්න, සචිත්‍රා අබේසේකර, සමන්ති වන්නිනායක, රවි තරංග බුලත්සිංහල, ගයිරික වීරසිංහ, සුමින්ද ජයනාත් ලංකාපුර, විහාන් සේනුර වන්නිනායක, නාමල් ගුණපාල, ඉමේෂ් චතුරංග, දනුල ජයරත්න, ප්‍රසාද් විජේසූරිය, ගයාන් බණ්ඩාර, සී. මාධව වීරසිංහ සහ කවීන් රන්දිම සිල්වා

## ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය තෝරා ගත් චීන ශිෂ්‍යත්වලාභීන්



රුවනි දර්ශිකා විජේරත්න මෙනෙවිය



සචිත්‍රා සංදීපනි මෙනෙවිය



දයේෂා අබේසුන්දර මෙනෙවිය



තුෂානි දිසානායක මෙනෙවිය

ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ සභාපති නීතිඥ ආනන්ද ගුණතිලක මහතා ප්‍රමුඛ නියෝජිත පිරිස 2013 මාර්තු 28 දා චීනයේ චුංෂාන් (Zhongshan) නාගරික ආණ්ඩුවේ නගරාධිපති චෙන් ලියැංශියෑං (Chen Lian gxian ) මහතා හමුවූ අවස්ථාව



ශ්‍රී ලංකා - චුංශාන් මිත්‍ර සංගම් අතර අවබෝධතා ගිවිසුම

ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ සභාපති නීතිඥ ආනන්ද ගුණතිලක මහතා සහ චුංශාන් නුවර විදේශ ජනතා මිත්‍ර සංගමයේ සභාපතිනිය අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමෙන් පසු





2014 අගෝස්තු 12 දා ටාජ් සමුද්‍රා හෝටලයේදී චුංශාන් නගරාධිපති චෙන් ලියැංශියාන් (Chen Liangxian) සමග ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ සභාපති හා නිලධාරීන් සාකච්ඡා කිරීම




2014 අගෝස්තු 12 දා ටාජ් සමුද්‍රා හෝටලයේදී පැවැත්වූ ශ්‍රී ලංකා චුංශාන් ව්‍යාපාරික සමුළුව අමතා ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ උප සභාපති ජනාධිපති නීතිඥ නිහාල් ජයවර්ධන මහතා ආරම්භක දේශනය පවත්වමින්



චුංශාන් නුවර පිහිණුම් පුහුණු පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ ශිෂ්‍යත්ව හිමි වූ රාජකීය හා ඩී. එස්. සේනානායක විද්‍යාලයීය ශිෂ්‍යයන් දෙදෙනා, නියෝජ්‍ය ලේකම් නාලක සේනානායක මහතා චුංශාන් නගරාධිපතිවරයාට හඳුන්වා දුන් අවස්ථාව

2013 මාර්තු මස චුංශාන් නුවරට ගිය ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ නියෝජිත පිරිස සමග ගුඅන්ශවු නුවර ශ්‍රී ලංකා කොන්සල් ජෙනරාල් යශෝජා ගුණසේකර මහත්මිය සහ චුන්ශාන් විදේශ කාර්යාලයේ උප නායක ජෝ චැන්ං ජුන්ෆෙන්ංග් (Joe Zhang Junfeng) මහතා.



## 61 වැනි චීන ජාතික දිනය සැමරීමට 2010 සැප්තැම්බර් 21 දා කොළඹ මහවැලි කේන්ද්‍රයේදී ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය සංවිධානය කළ ෆා හියන් හිමි අනුස්මරණ රැස්වීම





## 2011 සැප්තැම්බර් 23 දා ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය 62 වැනි චීන ජාතික දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පැවැත් වූ රැස්වීම






**ආපසු :**

**ආනන්ද ගුණතිලක**
**55/25, ගැමුණු මාවත,**
**උඩුමුල්ල පාර,**
**බත්තරමුල්ල.**


**යායුතු :**


බත්තරමුල්ල, උඩුමුල්ල පාර, ගැමුණු මාවත, අංක 55/25 හි පිහිටි ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමය වෙනුවෙන් එහි භාණ්ඩාගාරික ගාමිණී බණ්ඩාර රාජනායක විසින් ජා-ඇල, කෙලින් වීදිය, අංක : 52 හි රැජින ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් හි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.